www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 7 වන කොටස

## The Historical and International Foundations of the Socialist Equality Party—Part 7

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

### එස්ඩබ්ලිව්පීය තුල විපාර්ශවය - හතරවන ජාත්‍යන්තරයේ ඇමරිකානු කමිටුවෙහි නැගී ඒම

133. සමාජවාදී කම්කරු පක්ෂය තුල ටිම් වුල්ෆත්ගේ නායකත්වයෙන් වූ සුලුතර ප්‍රවනතාවක් පක්ෂයේ දැඩිවන අවස්ථාවාදී නැඹුරුවට විරුද්ධවෙමින් සෝෂලිස්ට් ලේබර් ලීගය එල්ල කල විවේචනයන්ට සහයෝගය දැක්වීය. මෙම ප්‍රවනතාවේ දැවැන්තම ශක්තිය වූයේ, එස්ඩබ්ලිව්පී හි දේශපාලන අර්බුදයට ප්‍රවිෂ්ට විය යුත්තේ එය ජාත්‍යන්තර ගැටලුවක් ලෙස ගනිමින්ය යන වැටහීම ඊට තිබීමයි. එබැවින් එස්ඩබ්ලිව්පීය තුල අරගලය, එක් හෝ තවත් දේශපාලන ප්‍රශ්නයක් පිලිබඳ සාකච්ඡාවකින් උපායික වාසි ලබාගැනීමේ දෘෂ්ටි ආස්ථානයක සිට ගෙන යා නොහැකිය. ඒ වෙනුවට සාකච්ඡාවේ මූලික එල්ලය, හතරවන ජාත්‍යන්තරයේ විප්ලවවාදී ඉදිරිදර්ශනයෙහි ප්‍රමුඛ ගැටලු පිලිබඳ දේශපාලන හා න්‍යායික පැහැදිලිකම ඇතිකර ගැනීම වනු ඇත. බ්‍රිතාන්‍ය එස්එල්එල් සිය ඇමරිකානු හිතවතුනට දුන් උපදේශය වූයේ, ද්වීතීයික දේශපාලන මතභේද හා සංවිධානාත්මක ප්‍රශ්න මත කන්ඩායමික ගැටුම හැකිතාක් දුරට වලක්වා ගනිමින්, එස්ඩබ්ලිව්පී කේඩරයන්ට භේදයේ දේශපාලන පැහැදිලිකම ලබාදීම සඳහා කටයුතු කලයුතු බවය. ජේම්ස් රොබට්සන්ගේ නායකත්වයෙන් යුත් තවත් සුලුතර ප්‍රවනතාවක් ගත්තේ මීට සපුරා වෙනස් මූලධර්මාත්මත ප්‍රවිෂ්ටයකි. ඔවුන් සිය ජාතික කන්ඩායම් උත්සුකතා ජාත්‍යන්තර පැහැදිලිකමට වඩා ඉහලින් තබාගත්හ.

134. වුල්ෆර්ත් නනායකත්වය දුන් සුලුතරය 1961 සිට 1964 දක්වා එස්ඩබ්ලිව්පී සංවිධානය ඇතුලත ක්‍රියාත්මක වූහ. 1963 යලි එකමුතුවේ සමුලුවට පසුවත් සුලුතරය, සමාජවාදී කම්කරු පක්ෂය ඇතුලත මූලධර්මාත්මක සාකච්ඡාවක් පවත්වාගෙන ගියහ. කෙසේවුව ද ලංකාවේ සිදුවීම් එස්ඩබ්ලිව්පීය ඇතුලත අරගලය හිනිපෙත්තට ගෙන ආවේය. හජාජාක ට හිතවත් සුලුතරය එස්ඩබ්ලිව්පීයේ සාමාජිකත්වය අතර ලිපියක් බෙදාහරිමින්, පක්ෂය ලසසපයේ පාවාදීමෙහි මූලයන් පිලිබඳ සාකච්ඡාවකට ඉඩ සැලසිය යුතුයයි ඉල්ලා සිටියහ. සුලුතරය 1964 ජූනි මාසයේ නිකුත්කල ප්‍රකාශනයෙන් මෙසේ කියා සිටියහ.

> ක්‍රියාත්මක වශයෙන් යලි එකමුතු වීමට **පූර්වයෙන්,** පූර්න දේශපාලනික සාකච්ඡාවක් නොමැතිව, හතරවන ජාත්‍යන්තරය යලි එකමුතු කලොත් එය, ජාත්‍යන්තර ව්‍යාපාරයෙහි ද මෙහි තිබෙන පක්ෂයෙහි ද විනාශයට හා තව දුරටත් විසිර යාමට පමනක් ම තුඩු දෙනු ඇතැයි 1961 හි සිට 1963 දක්වා කාලය තුල ජාත්‍යන්තර කමිටුව සමග දේශපාලනික සහයෝගිතාවෙන් යුතු ව අපි නැවත නැවතත් කියා සිටියෙමු. **අපගේ ආස්ථානයෙහි යුක්ති යුක්ත භාවය මුලුමනින්ම සනාථ කෙරී ඇත.**
>
> අපගේ පක්ෂයත් එය වර්තමානයෙහි දේශපාලනික සහයෝගිතාවෙන් සම්බන්ධව තිබෙන ජාත්‍යන්තර ව්‍යාපාරයත් එහා මෙහා ඇද ඉරා දමන දේශපාලනික, න්‍යායික හා විධික්‍රමික අර්බුදයට මුහුන දීම මින් ඉදිරියට, තවදුරටත්, ප්‍රතික්ෂේප කල නොහැකි වනු ඇත. **පක්ෂයෙහි පැවැත්ම ම උදෙසා වුව, මෙම ප්‍රශ්න පිලිබඳව පූර්න සාකච්ඡාවක් සියලුම ශාඛාවල ක්ෂනිකව ම සංවිධාන කල යුතු ය.** [84]

135. මෙම ලිපිය නිකුත් කිරීමෙන් පසුව ඊට අත්සන් තැබූ 9 දෙනාගේ ම පක්ෂ සාමාජිකත්වය තහනම් කරන ලදී. සුලුතරය, හතර වන ජාත්‍යන්තරයේ ඇමරිකානු කමිටුව ගොඩනගමින්, ජාත්‍යන්තර කමිටුව සමඟ දේශපාලන සහයෝගය මත, එය නව ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය පුලුල් සූදානම අතිකර ගැනීමට අත ගැසීය.

## හජාජාක තුන්වන සමුලුව

136. යලි එකමුතුවීමෙන් පසුව, හජාජාක පැබ්ලෝවාදයට එරෙහි අරගලයේ පාඩම් හා එහි වෛෂයික වැදගත්කම අගැයිය යුතුව තිබුනි. 1966 අප්‍රේල්හි දී ජාත්‍යන්තර කමිටුව සිය තුන්වන සමුලුව පවත්වන ලදී. එහි අරමුන වූයේ ලෝක ට්‍රොට්ස්කිවාදී බලවේගයන් රැලිකර ගැනීමත්, ලෝකය පුරා ට්‍රොට්ස්කිවාදී පක්ෂ ගොඩනැගීම සඳහා පදනම දමාගැනීමත්ය. සමුලු යෝජනාව. ලෝක අධිරාජ්‍යවාදය තුල ගැඹුරුවන ප්‍රතිසතිතා මෙන්ම පශ්චාත් යුද කාලීන උත්පාතය පිරිහීමේ සලකුනු ද පෙන්වා දුන්නේය. එහි මෙසේ සඳහන් විය.

> අධිරාජ්‍යවාදය ගැඹුරුවන අර්බුදයක නිමග්නව ඇත. දෙවන ලෝක සංග්‍රාම අවධියේ හා ඉන් පසු, න්‍යෂ්ටික අවි නිෂ්පාදනය හා ස්වයංක්‍රීය නිමැවුම් අඩංගු කර ගත් නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය, ඒවා හා ධනේශ්වර දේපල සම්බන්ධතාවන් දෙදරුම් කන තැනකට ගෙනැවිත් තිබේ. මෙම ප්‍රතිසතිතාවන් මඟින් ඇතිකරන අරගල කම්කරු පන්තික තරුනයන් පෙරලිකාරී කරනු ඇත. මෙම අරගලයන් තුලින් හතර වන ජාත්‍යන්තරයේ පක්ෂ ගොඩනැගිය යුතුය.

137. කොන්ග්‍රසයේ යෝජනාව, කම්කරු පන්තියේ විප්ලවකාරී අරගලය අවහිර කිරීමට පැබ්ලෝවාදී සංශෝධනවාදය ඉටුකල ක්‍රියාකලාපය අවධාරනය කලේය.

> සංවර්ධිත රටවල විප්ලවය, 'යටත්විජිත විප්ලවය,' හා 'කම්කරු' රාජ්‍යයන්හි දේශපාලන විප්ලවය යනාදි වශයෙන් විප්ලවය එකිනෙකින් වෙන්කිරීම මඟින් සංශෝධනවාදීහු, කම්කරු ව්‍යාපාරයේ ධනේශ්වර ආධිපත්‍ය සඳහාත්, විප්ලවවාදී පක්ෂ ගොඩනැඟීම වැලැක්වීම සඳහාත් බෙහෝ වැදගත් ආවරනයක් සම්පාදනය කලහ. තමන්ගේ ම මෝස්තරය ට, න්‍යායික හා දේශපාලන ප්‍රශ්න සාකච්ඡා කිරීමකින් තොරව සකස්කල හතර වන ජාත්‍යන්තරයේ එක්සත් ලේකම් මන්ඩලයෙහි න්‍යාය හා භාවිතය තුල සංශෝධනවාදය සුවිශේෂිතව ප්‍රකාශයට පත්විය. හතර වන ජාත්‍යන්තරය ගොඩනැගීමේ ඊලඟ අදියර මෙයට පටහැනිව, වර්තමානයේ ද, අතීතයේ ද ව්‍යාපාරයේ ප්‍රතිපත්ති හා න්‍යාය පිලිබඳ සියලු අංශවල අතිශය බැරෑරුම් න්‍යායික සාකච්ඡාවක් මඟින් අංගලක්ෂිත විය යුතු ය. [85]

138. ජාත්‍යන්තර කමිටුව, අතීත අරගලයන්ගේ පාඩම් මත හතරවන ජාත්‍යන්තරයේ වර්ධනය පදනම් කිරීමේ අවශ්‍යතාවය අවධාරනය කලේය. එමෙන්ම එය, හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ දේශපාලනිකව හා න්‍යායිකව තීරනාත්මක මූලාශ්‍රයක් වන්නේ, පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහි අරගලය බවද අවධාරනය කලේය. එය වඩාත් වැදගත් වන අනෙකෙන්, එනම් පක්ෂ ගොඩනැගිමේ කාර්යයෙන් ඉවතට හැරීමක් නොවේ. ධනේශ්වරය විසින් යොදන ලද දෘෂ්ටිමය පීඩනයන් කපාහරිමින් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය සිය විප්ලවවාදී ඉදිරිදර්ශනය වර්ධනය කලේ හරියට ම, මාක්ස්වාදය සංශෝධනය කිරීමට එරෙහි අඛන්ඩ අරගලය තුලදී ම ය. සංශෝධනවාදයට එරෙහි අරගලයේ ඓතිහාසික හා දේශපාලන ඇඟවුම් පිලිබඳ මෙම සංකල්පයට, තුන්වන සමුලුවට ආරාධනා කරනු ලැබ සිටි ප්‍රවනතා දෙකක් විසින් විරෝධය පලකරන ලදී. වෝයි ඔවුරියේ හා ජේම්ස් රොබට්සන්ගේ ස්පාටසිස්ට් ප්‍රවනතාවන්ට ආරාධනා කරන ලද්දේ, මූලධර්මාත්මක දේශපාලන සහ සංයෝගයකට එලඹිය හැකිද යන්න නිගමනය කිරීමටය. සංවිධාන දෙකම ඔප්පු කලේ එවැන්නක් කල නොහැකි බවයි.

139. මෙම කන්ඩායම් දෙකට අනුව හජාජාක, පැබ්ලෝවාදය හා හතරවන ජාත්‍යන්තරය තුල දේශපාලන අරගලයේ වැදගත්කම බෙහෙවින් අධි තක්සේරු කලේය. 1966 සමුලුවේදී රොබට්සන් මෙසේ ප්‍රකාශ කලේයඃ

> ධනවාදයේ වත්මන් අර්බුදය එතරම්ම තියුනු හා ගැඹුරු වන බැවින්, කම්කරුවන් හීලෑකිරීම සඳහා ට්‍රොට්ස්කිවාදී සංශෝධනවාදීන්ගේ උදව් බලාපොරොත්තුවේය යන මතිය අපගේ අවධානයට ලක්විය. එය පරිහානිගතවූ දෙවන හා තුන්වන ජාත්‍යාන්තර වලට සමාන ආකාරයකින් ඉදිරිපත් කරයි. එවන් දෝෂ සහගත තක්සේරුවක් අපගේ වර්තමාන වැදගත්කම ඉමහත් ලෙස අධිතක්සේරු කරන තැනකට වැටී ඇති බැවින් නොමඟයවන සුලුය. [86]

140. සුලු ධනපති රැඩිකල් වාදයෙන්, මාක්ස්වාදය න්‍යායිකව හා දේශපාලනිකව වෙන්කරන්නාවූ සියල්ල මේ ප්‍රකාශය තුල සාරාංශගතව තිබේ. සාරය වශයෙන්, හතරවන ජාත්‍යන්තරය තුල ගැටුමේ වෛෂයික සමාජ හා දේශපාලන වැදගත්කම, රොබට්සන්ගේ හෙලාදැකීමට ලක්වෙයි. සංශෝධනවාදයට එරෙහිව බොල්ශෙවික් පක්ෂය ගොඩනැගීමේ ලෙනින්ගේ අරගලයෙහි ද, පසුව ස්ටැලින්වාදයට හා මාධ්‍යමිකවාදයේ විවිධ

රුපාකාරයන්ට එරෙහි ට්‍රොට්ස්කිගේ අරගලයෙහි සියලු පාඩම් ද නොතකා හැරේ. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුකාලයේ ප්‍රධාන දේශපාලන හා සමාජ ක්‍රියාවලීන් සමග එතරම්ම පැහැදිලිව බැඳී ඇති, හතරවන ජාත්‍යන්තරය ඇතුලත පැබ්ලෝවාදයට එරෙහි අරගලය, රොබට්සන් විසින්, අඩු හෝ වැඩි වශයෙන්, විවිධ පුද්ගලයන් අතර ඇතිවූ ආත්මීයව ප්‍රේරිත කාලගෝට්ටියක තත්වයට පිරිහෙලා තිබේ. තවද රොබට්සන්ගේ පරිනාමය සිදුවූයේ ලසසපය ධනේශ්වර හවුල් ආන්ඩුවට ඇතුල්වීමෙන් දෙවසරකටත් අඩු කාලයකට පසුවය!

## පැබ්ලෝවාදය, නව වාමාංශය හා ගරිල්ලාවාදය

141. රොබට්සන් මෙම ප්‍රකාශ කරන අතරතුර, ලඟාවෙමින් තිබූ සමාජ කැලඹීම් තුල ධනේශ්වරය මෙන්ම ස්ටැලින්වාදීන් ද විශ්වාසය තැබුවා වූ, දේශපාලන මුක්කු හා බෆරයන්, පැබ්ලෝවාදීන් විසින් ගොඩනගමින් සිටියහ. එක්සත් ජනපදයේ දී වර්ධනය වන වියට්නාම් යුද විරෝධී ව්‍යාපාරය ධනපති ඩිමොක්‍රටික් පක්ෂයට යටත් කිරීමේ ලා එස්ඩබ්ලිව්පීය තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කරමින් සිටියහ. යුරෝපය පුරා ම පැබ්ලෝවාදී සංවිධාන, ස්ටැලින්වාදී හා "නව වාමාංශය" නම් සුලු ධනපති ප්‍රවනතාවන්ට අනුගත වෙමින්, 1968 පැනනැගි මහජන විරෝධතා ව්‍යාපාර අවමංගත කිරීමේ හා පීලිපැන්නවීමේ ලා ඉක්මන් හා වැදගත් දායකත්වයක් සැපයූහ. විශේෂයෙන්ම ප්‍රන්සයේ දී පැබ්ලෝවාදීන්, එම වසරේ මැයි-ජූනි මාසවල කම්කරු පන්තියේ විප්ලවවාදී නැගිටීම් පාවාදීමේ දී ස්ටැලින්වාදීන්ට මුක්කුව සැපයූහ. තවදුරටත් චෙකෝස්ලොවේකියාවේදී 1968 "ප්‍රාග් නැගිටීම" සේ ම පෝලන්තයේ වැඩ වර්ජන රැල්ල පෙන්නුම් කලේ, ස්ටැලින්වාදී තන්ත්‍රයන් දැනටමත් ආන්තික අර්බුදයකට අවතීර්නව ඇති බවයි. සිය ස්වයං ප්‍රතිසංස්කරනයේ නිලධරයන් පිලිබඳ න්‍යාය අතැතිව පැබ්ලෝවාදී සංවිධාන, ස්ටැලින්වාදී තන්ත්‍රයන්ට එරෙහි නිර්ධය අරගලයක් මඟින් ඔවුන් පෙරලා දැමීම සූදානම් කිරීම වෙත සිය අවධානය යෙදීමෙන් හතරවන ජාත්‍යන්තරය ඉවතට හැරවූහ. 1960 ගනන් මැද වනවිට, ස්ටැලින්වාදයේ බිඳවැටීම, අවසානයේදී අනම්‍යව ම, සෝසසසං තුල මෙන්ම නැඟෙනහිර යුරෝපයේත් දක්ෂිනාංශික හා ධනේශ්වර ගැති තන්ත්‍රයන් ගොඩනැගීම කරා යොමුවනු ඇතැයි පූර්ව නිගමනයවී තිබුනේ නැත. නිසැකව ම 1960 ගනන්වල දී නැඟෙනහිර යුරෝපය තුල ස්ටැලින්වාදී කෲරත්වයට එරෙහි අරගලයන්, වාමාංශික හා සමාජවාදී නැඹුරුවක් ගත්තේය. නැඟෙනහිර යුරෝපය තුල, සෝවියට් සංගමයෙහි හා ඒ අනුව චීනයේ ද, පසුව ඇතිවූ ප්‍රතිගාමී නැඹුරුව, පැබ්ලෝවාදීන් අනුගමනය කල සාවද්‍ය හා ප්‍රතිගාමී ප්‍රතිපත්තීන් මඟින් සැලකිය යුතු දුරකට හැඩගස්වනු ලැබූ දේශපාලන කොන්දේසිවල නිමැවුමක් විය.

142. පැබ්ලෝවාදීන්ගේ පාවාදීම් අතර, කැස්ට්‍රෝවාදය හා ගරිල්ලාවාදය පිලිබඳව ඔවුන් කල හුවාදැක්වීම මගින් ඇතිකල ප්‍රතිවිපාකයන් ද වෙයි.. 1970 ගනන්වල චිලියේ, ආර්ජන්ටිනාවේ, බොලීවියාවේ හා උරුගුවේහි සිදුවූ දේශපාලන ව්‍යසනයන්, පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලය විසින් පෙරට දැමූ න්‍යායන් හා ප්‍රතිපත්තීන්හි ප්‍රතිවිපාකයන් ය. එක්සත් ලේකම් මන්ඩලය විසින් ට්‍රොට්ස්කිවාදය හැර දැමූ බවට නිකුත් කල දේශපාලන සංඥාව වූයේ, අර්නස්ටෝ "චේ" ගුවේරා උත්කර්ෂයට නැංවීමයි. ආර්ජන්ටීනියානු රැඩිකල්වාදියෙකු වූ ඔහු, ඔහුගේ පරම්පරාවේ බොහෝ ලතින් ඇමරිකානු බුද්ධිමතුන් මෙන්ම, විශේෂයෙන්ම කම්කරු පන්තියේ විප්ලවවාදී ක්‍රියාකලාපය පිලිබඳ සංකල්පය ප්‍රතික්ෂේප කලේය. ට්‍රොට්ස්කිගේ ඝාතකයාවූ රේමොන් මර්කේඩර්, 1960 දී මෙක්සිකෝ බන්ධනාගාරයෙන් නිදහස ලබා කියුබාවට පැමිනිකල ඔහු පිලිගත්තේ අන් කිසිවෙකු නොව ගුවේරාය යන කාරනයේ දී පැබ්ලෝවාදීහු, එය නොදන්නා සේ හැසිරෙති. කම්කරු පන්තිය මත පදනම් වීමේ මූලෝපායට විකල්පයක් සොයා ගැනීම සඳහා පැබ්ලෝවාදීහු, ලතින් ඇමරිකානු සමාජවාදී තරුනයන්ට කැඳවුම් කලහ. බොලීවියානු පැබ්ලෝවාදියෙකු වූ මොස්කොසෝ ලිවූ පරිදි:

> කියුබානුවන් විසින් අනුගමනය කල ගරිල්ලා ක්‍රමවේදයේ ආකෘතිය, එක් එක් රටෙහි සුවිශේෂී තත්වයන්ට අනුව වෙනස් වන්නේවී නමුදු, සියලු නොදියුනු රටවලට යෙදිය හැකිය. නොවිසඳුනු ඉඩම් ප්‍රශ්නය සහිත දැවැන්ත ගොවි ජනතාවක් ජීවත් වන්නාවූ එම රටවල, ගරිල්ලාවරු සිය ශක්තිය ගොවිජනතාව වෙතින් උකහාගනු ඇත, ඔවුන්ගේ කෘෂිකාර්මික ගැටලු විසඳමින්, ආයුධ අතැතිව සියෙරා මයෙස්ට්‍රාවෙන් පටන් ගෙන කියුබාවේ සිදුවූ ආකාරයට ගරිල්ලාවරු, මෙම ජනතාව පුබුදුවා ලනු ඇත. එහෙත් අනෙකුත් රටවල දී, නාගරික නිර්ධනීන් හා පෙරලිකාරී සුලු ධනේශ්වරය, ගරිල්ලා බලවේගයන් සම්පාදනය කරනු ඇත. [87]

## හතරවන ජාත්‍යාන්තරය' යලි ගොඩනැගීමට' එරෙහිව' අඛන්ඩතාවය'

143. හජාජාක හා විශේෂයෙන්ම සෝෂලිසට් ලේබර් ලීගයේ ට්‍රොට්ස්කිවාදීහු, 1966 සම්මේලනයේ දී මෙන්ම ඉන් පසුවත් පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහි අරගලය අවඥාවට ලක් කිරීමේ සියලු උත්සාහයන්ට විරුද්ධ වෙමින් ප්‍රබල දේශපාලන

දුරදක්නා බවක් ප්‍රදර්ශනය කලහ. "පැබ්ලෝවාදයට එරෙහි අරගලය ග්‍රහනය කර ගැනීමේ පලමු පූර්වාවශ්‍යතාවය, මාක්ස්වාදය වර්ධනය කිරීමේ සටන හා සමඟම මාක්ස්වාදී න්‍යායේ අතීත සියලු ජයග්‍රහන ආරක්ෂා කිරීමයි. ජාත්‍යන්තර කමිටුවේ 1966 සමුලුවේ දී, හජා තුල සිය අරගලය මඟින්, ව්‍යාපාරයේ අඛන්ඩතාවය නියෝජනය කල බව අවධාරනය කරමින් ජාක මෙය පැහැදිලිව ප්‍රකාශ කලේය. වෝයේ ඔවුරියේ හා රොබට්සන්ට එදිරිව, අප කියා සිටියේ, මාක්ස්වාදය සුරක්ෂිත කලේ හා බොල්ශෙවික්වාදී විප්ලවවාදී පක්ෂයේ න්‍යාය වර්ධනය කලේ පැබ්ලෝවාදයට එරෙහි අරගලය පමනක් බවයි." 1967 දී එස්එල්එල් එසේ ලිවීය. [88]

144. හතරවන ජාත්‍යන්තරයේ ප්‍රන්ස ශාඛාව වූ ඕගනයිසේෂන් කොමියුනිස්ට් ඉන්ටර්නැෂනල් (ඕසීඅයි) 1966 සමුලුවේ දී එස්එල්එල් ආස්ථානයට සහාය දුන්නේ ය. කෙසේවුව ද එය තර්ක කලේ, හතරවන ජාත්‍යන්තරය "යලිගොඩනැගීම" කල යුතු බවටය. පැබ්ලෝවාදය සමඟ භේදයෙන් පැන නැගුනු සෙයින්, හතරවන ජාත්‍යන්තරයේ වලංගු භාවය වෙත සැලකිය යුතු තරමේ සංශයවාදයක් ප්‍රකාශයට පත්කල මෙම ව්‍යාකුල යෙදුම අවධාරනය කිරීම ඕසීඅයිහි ම මාධ්‍යමික නැඹුරුව පෙන්නුම් කලේය. 1967 දී ඕසීඅයි අවධාරනය කිරීමට පටන් ගත්තේ පැබ්ලෝවාදය සමඟ ප්‍රධාන ගැටලුව වන්නේ ස්ටැලින්වාදය හා ධනේශ්වර ජාතිකවාදය කරා එහි දිශානතිය නොව, විවෘතව ම මධ්‍යගතව ඇති එහි නිලධාරිවාදී ක්‍රමවේදයන් බවටය. කර්තව්‍යය වන්නේ "එක්සත් පෙරමුනු" උපාය මත යොමුවූ වඩාත් "නම්‍යශීලී" සංවිධාන ගොඩනැගීම බව ඕසීඅයි අවධාරනය කලේ ය. එස්එල්එල් දුර දක්නා අනතුරු අඟවීමක් ඕසීඅයි නායකත්වය වෙත නිකුත් කලාය.

> දැන් බටහිර යුරෝපයේ පෙරලිකාරී වන කම්කරුවෝ විශේෂයෙන් ම ප්‍රන්සයේ, වේගයෙන් පෙරට ඇදෙමින් සිටිති. වර්ධනයේ එවන් අවධියක දී සෑම විටම අන්තරායක් පවතියි. කම්කරු පන්තිය තුල තත්වයට විප්ලවවාදී පක්ෂය. විප්ලවවාදී ආකාරයකට ප්‍රතිචාර නොදක්වමින් අරගලයේ මට්ටමට අනුගත වීමේ තැනකට ඇද වැටිය හැකිය. එහි දී පැරනි නායකත්වයන් යටතේ ලැබූ, තමන්ගේ ම අත්දැකීම් හමුවේ කම්කරුවන් කොටුවනු ඇත. එනම් නොවැලැක්විය හැකි ආරම්භක ව්‍යාකුලත්වයටයි. ස්වාධීන පක්ෂය හා සංක්‍රමන ක්‍රියාමාර්ගය සඳහා අරගලය පිලිබඳ සංශෝධන, එනම් කම්කරු පන්තියට සමීපවීම, අරගලයේ දී සියල්ලන් සමඟ එකමුතුව, අවසන් නිවේදන නිකුත් නොකිරීම, අධානග්‍රාහිත්වය යනාදියෙන් දවටා වෙස්ගැන්වීම සාමාන්‍යයෙන් කරනු ලබන්නකි. [89]

## ව කර්ස් ලීගය ගොඩනැගීම

145. තුන්වන සමුලුවේ අත්දැකීම් මත පදනම්ව, හතරවන ජාත්‍යන්තරය සඳහා වූ ඇමරිකානු කමිටුව, හජාජාක සමඟ සහයෝගීව නව ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් පිහිටුවීමේ සිය ආරම්භක වැඩ කටයුතු අවසන් කලේය. ව'කර්ස් ලීගයේ ආරම්භක සමුලුව 1966 නොවැම්බරයේ පවත්වන ලදී. ශිෂ්‍ය සමූහයන් අතර වියට්නාම් යුද්ධය කෙරෙහි විරෝධය ද, ප්‍රධාන නගරවල පැනනැගි අප්‍රිකානු - ඇමරිකානු කම්කරුවන්ගේ හා තරුනයන්ගේ ප්‍රචන්ඩ අරගල ද, කම්කරු පන්තියේ සැලකිය යුතු කොටස්වල වැඩ වර්ජන ද, පෙන්නුම් කලේ ඇමරිකානු ධනවාදයේ ගැඹුරුවන අර්බුදයේ පැහැදිලි ඇඟවීම් ය. එස්ඩබ්ලිව්පීය සිය ට්‍රොට්ස්කිවාදී උරුමය අත්හරිමින් හා එකී ව්‍යාපාරවල ආධිපත්‍ය දැරූ සුලු ධනපති ප්‍රවනතාවන්ට අනුගතවෙමින් මෙම වර්ධනයන්ට ප්‍රතිචාර දැක්වූහ. සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය එකමුතුවකට ගෙන ඒමේ අරගලයට ආදේශකයක් ලෙස ඔවුන්, කලු ජාතිකවාදය හුවා දැක්වීම මඟින් දේශපාලන අවස්ථාවාදයේ සිය ප්‍රකාශනය සොයාගත්තේය. එස්ඩබ්ලිව්පීය, වෙනම කලු ජාතියක් සඳහා ඉල්ලීම ද ඇතුලත්, කලු ජාතිකවාදය වැලඳ ගැනීමෙන් පෙන්නුම් කලේ විප්ලවවාදී බලවේගයක් ලෙස ඇමරිකානු කම්කරු පන්තිය අවලංගුකර දැමීමේ එහි නැඹුරුවයි. මෙම ඉදිරිදර්ශනය පෙන්නුම් කලේ නව වාමාංශයේ බලපෑමයි. ඔවුන් සිය න්‍යායික අවේශයෙන් වැඩි කොටස උකහාගත්තේ හර්බර්ට් මාකියුස්ගේ මූලිකව ම ප්‍රති මාක්ස්වාදී සංකල්පයන්ගෙනි. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ ප්‍රමුඛ නියෝජිතයෙක් වූ ඔහු කම්කරු පන්තිය අංගලක්ෂනය කලේ ඇමරිකානු සමාජය තුල "ප්‍රාථමික-ෆැසිස්ට් " (proto-fascist) මූලයක් ලෙසය.

146. ව'කර්ස් ලීගයේ ආරම්භය, 1953 පටන් හතරවන ජාත්‍යන්තරය ඇතුලත ගෙනගිය අරගලය තුල මුල්බැස තිබුනි. එක්සත් ජනපදය තුල මාක්සවාදය සඳහා අරගලයේ සැතපුම් කනුවක් එමඟින් සලකුනු කලේය. මාක්ස්වාදයේ වර්ධනය ඉදිරියට ගෙන යා හැක්කේ, ඇමරිකානු කම්කරු පන්තියේ විප්ලවවාදී ස්වභාවයත්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට එරෙහි අරගලයේ දී එහි තීරනාත්මක ක්‍රියාකලාපයත් හඳුනාගැනීමේ පදනම මත පමනි. මෙම ඉදිරිදර්ශනය සාක්ෂාත් කල හැක්කේ, 1960 ගනන් අග හා 1970 ගනන් මුල ප්‍රචලිතව පැවති ජාතික, වාර්ගික, ලිංගිකත්වය හා ලිංගික අනන්‍යතාවය හුවාදැක්වීමේ යෙදී සිටින ගනන් නැති සුලු ධනපති රැඩිකල් ප්‍රනතාවන්ට එරෙහි අශමනීය අරගලයක පදනම මත පමනි. ව'කර්ස් ලීගයේ සමාරම්භක සමුලුවට එස්එල්එල්

නායක ජෙරී හීලි එවූ ශුභපැතුම් පනිවිඩයෙහි ඔහු මෙසේ සඳහන් කලේය.

> එක්සත් ජනපදයේ කම්කරු පන්තිය ලෝකයේ බලගතුම කම්කරු පන්තිය වන අතර ඔබ ඔබගේ පක්ෂය ගොඩනැගිය යුත්තේ එය තුලයි. මෙය මාක්ස්වාදයේ ප්‍රධාන මූලධර්මයක් වන අතර එක්සත් ජනපදය ඇතුලත පවතින තත්වයට විශේෂිත හදිසි භාවයකින් යෙදෙන්නකි. අපගේ අවධියේ මූලික ප්‍රශ්න විසඳනු ඇත්තේ රට පුරා පැතිර ඇති දූසිම් ගනනක් වන සාම හා සිවිල් අයිතිවාසිකම් සංවිධාන නොව විප්ලවවාදී පක්ෂයක් විසින් මෙහෙයවනු ලබන කම්කරු පන්තිය විසිනි. සංශෝධනවාදීන්ගෙන් අප දැඩිලෙස වෙන්වී ගත යුත්තේ හරියට ම මේ අවස්ථාවේ ය. මධ්‍යම පන්තික ව්‍යාපාරවලට මෙන්ම නීග්‍රෝවරුන්ට ම ඇමරිකානු අධිරාජ්‍යවාදය සමඟ ගනුදෙනු බේරාගත හැකිය යන ඔවුන්ගේ අදහස අපි තරයේ ම ප්‍රතික්ෂේප කරන්නෙමු. එවන් ව්‍යාපාරයන් වෙත කවරාකාරයක විවේචනාත්මක සහයෝගයක් හෝ පලකිරීමේ දී, ඔවුන්ගේ දුබලකම් පිලිබඳ අපගේ විවේචන ඉදිරිපත් කිරීමේ පදනම මත එය සිදු විය යුතුය. [90]

147. ව'කර්ස් ලීගය හමුවේ ඇති ප්‍රධාන කර්තව්‍ය, ධනේශ්වරයෙන් හා එහි දේශපාලන පක්ෂවලින් විශේෂයෙන්ම ඩිමොක්‍රටික් පක්ෂයෙන්, ඇමරිකානු කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය පිහිටුවාලීම සඳහා සටනයි. ඒඑෆ්එල්-සීඅයිඕ යන ජනතා වෘත්තීය සමිති, සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම්වූ කම්කරු පක්ෂයක් ගොඩනැගිය යුතුය යන ඉල්ලීම හැඩගැසී ආවේ එවකට එක්සත් ජනපදය තුල පැවති කොන්දේසිවලට අනුකූලව ය. මෙම ඉල්ලීම, 1930 ගනන්වල අත්දැකීම් තුලින් හා පලමුවෙන් ට්‍රොට්ස්කි විසින් යෝජනාකල පරිදි මතුව ආ අතර එස්ඩබ්ලිව්පීය විසින් 1950 ගනන්වල තමන් මධ්‍යම පන්තික විරෝධතා ව්‍යාපාරවලට නැඹුරුවෙමින් සිටිය දී බෙහෝකොට ම අත්හැර දමා තිබුනි. ව'කර්ස් ලීගයේ ආරම්භක සම්මෙලනයේ සිය මූලික යෝජනාවෙන් ඔවුන් එය මෙසේ යලි පන ගැන්වීය.

> පාලක පන්තියට හා එහි දේශපාලන උපකරනයන්ට එරෙහි මූලික දේශපාලන අරගලයක දී කම්කරු පන්තිය, හුදෙකලා ආර්ථික සටන් ඉක්මවා යැමේ අවශ්‍යතාවය පෙන්නුම්කල යුතුය. එබැවින් ලේබර් පක්ෂය සඳහා ඉල්ලීම එක්සත් ජනපදය තුල අපගේ සියලු වැඩ කටයුතුවල ඒකාබද්ධ ඉල්ලීම බවට පත්විය යුතුය. කම්කරු පන්තික තරුනයන් අතර, වෘත්තීය සමිති තුල, සුලු ජන කොටස් අතර හා යුද ප්‍රශ්නය වටා අපගේ සියලු ප්‍රචාරක කටයුතු තුල එය පැතිර යා යුතුය...
>
> වාර්ගික දේශපාලනයට ඉඩ හරිනවාට වඩා, පොදු පීඩකයාට එරෙහි පොදු අරගලයක් තුල කලු හා සුදු කම්කරුවන් එකමුතු කරන ලේබර් පක්ෂයක් සඳහා අප අරගල කල යුතුය. ලේබර් පක්ෂයක් සඳහා වූ සංකල්පය අප යුද විරෝධී ව්‍යාපාරය තුලට ගෙනයා යුතුය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ යුද පිලිවෙත් අධිරාජ්‍යවාදීන්ගේ කම්කරු පන්ති විරෝධී අනෙකුත් ප්‍රතිපත්ති වලින් වෙන්කල නොහැකිය. "යුද්ධයේ ප්‍රශ්නය" සඳහා සටන් වැදීමට "පන්ති විරහිත" පදනම මත මධ්‍යම පන්තික දේශපාලන පක්ෂ ගොඩනැගීම නිරර්ථක උත්සාහයකි. එය සේවය කරන්නේ ඒවාට බැඳී ඇති පන්ති අවශ්‍යතාවන් පැහැදිලි කිරීමට වඩා ඒවා වහංගු කිරීමට ය. [91]

148. වෘත්තීය සමිති මත පදනම් වූ ලේබර් පක්ෂයක් ගොඩනැගීම සඳහා කල සටන ඊලග 25 වසර පුරා, ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරය විසින් කම්කරු පන්තිය ඩිමොක්‍රටික් පක්ෂයට දේශපාලනිකව යටත් කිරීමට එරෙහිව ව'කර්ස් ලීගය ගෙනගිය අරගලය තුල ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටුකලේය. මෙම ඉල්ලීම, විප්ලවවාදී පක්ෂයට ප්‍රතිසංස්කරනවාදී ආදේශකයක් ගොඩනැගීම සඳහා කල යෝජනාවක් ලෙස පිලිසිඳ නොගත්තේ ය. එනම් බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂයේ හෝ කැනඩාවේ නව ඩිමොක්‍රටික් පක්ෂයේ ඇමරිකානු සංස්කරනයක් ලෙස නොවේ. එය යෝජනා කලේ පන්ති සහයෝගිතා දේශපාලනයේ දඬු අඩුව බිඳිමින්, කම්කරු පන්තියේ විප්ලවවාදී දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමේ මාධ්‍යයක් ලෙස ය. තවද, ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධාන, සිමිත ආකාරයකින් හෝ කම්කරු පන්ති අරගලයේ උපකරනයක් ලෙස ද, පන්ති විඥාත කම්කරුවන්ගේ සැලකිය යුතු කොටස්වල සහයෝගය ගොනුකිරීමේ ද, යෙදී සිටිනතාක් දුරට, සමාජවාදී ප්‍රතිපත්තීන්ට කැපවූ ලේබර් පක්ෂයක් ගොඩනැගීම සඳහා කෙරෙන ඉල්ලීම, වෘත්තීය සමිතිවාදයේ සීමාවන් ඉක්මවා යන මඟක් ඇඟවුම් කරන, පැහැදිලි දේශපාලන මග පෙන්වීමක් කම්කරු පන්තියට සපයමින්, විප්ලවවාදී හා සමාජවාදී පන්ති විඥානයක් වර්ධනය කිරීමේ සැලකිය යුතු ක්‍රියා කලාපයක් ඉටුකරනු ලබයි. ගෝලීය ධනේශ්වර ව්‍යුහය තුල සිදුවූ වර්ධනයන්ගේ ප්‍රතිපලයක් ලෙසත්, වෘත්තීය සමිති විසින් කම්කරු පන්ති අරගලයන් මහා පරිමානයෙන් පාවාදීමේ සමුච්චිත බලපෑමත්, යටතේ වෘත්තීය සමිතිවල ස්වභාවය හා කම්කරු පන්තියට ඒවායේ ඇති සම්බන්ධයේ වෛෂයික ස්වභාවය වෙනස් කල තතු හමුවේ, පසු කාලයේ දී කම්කරු පක්ෂය සඳහා වූ

ඉල්ලීම අතහැර දැමීමට ව'කර්ස් ලීගයට බලකෙරුනි.

149. ට්‍රොට්ස්කිවාදය හා සංශෝධනවාදය අතර දිගින් දිගටම ඇතිවූ ගැටුම දිගහැරුනේ, උග්‍රවන දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වයක පසුබිමෙහි ය. දෙවන ලෝක යුද්ධය අවසන් වන විට එක්සත් ජනපදය සතුව පැවති ඉහ වහා ගිය ආර්ථික අධිකාරය - ලෝක ධනවාදය ප්‍රති නිර්මානයේ හා යලි තහවුරු කිරීමේ දී තීරනාත්මක වූ - 1950 හා 60 ගනන් තුල බාදනය වී ගියේය. ඇමරිකානු ප්‍රාග්ධනය විදේශයන්ට නිර්යාත කිරීමේ ක්‍රියාවලිය, 1960 ගනන් වන විට පශ්චාත් යුද්ධ සමතුලිතයේ බිඳවැටීම සලකුනු කල ඩොලර් අර්බුදයක් නිර්මානය කලේය. අර්බුදය සමහන් කිරීමට දරනලද සියලු උත්සාහයන් අසාර්ථක වීමෙන් පසුව, 1971 අගෝස්තු 15 වන දින ඩොලර්-රත්රන් හුවමාරුව අවසන් කරමින් එක්සත් ජනපදය බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ පදනම විනාශකර දැමීය. බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ බිඳවැටීම නව ආර්ථික හා දේශපාලනික කැලඹීම්වලට තුඩුදෙන බව සෝෂලිස්ට් ලේබර් ලීගය විසින් හඳුනාගත්ත ද, ජාත්‍යන්තර කමිටුව තුල මෙන්ම එස්එල්එල් තුල ද පැවති නොවිසඳුනු ප්‍රශ්න, ඉමහත් දේශපාලන ප්‍රතිවිපාක ගෙන ආවේය.

## ජාත්‍යන්තර කමිටුව තුල භේදය

150. හජාජාක තුන්වන සමුලුවෙන් පසුව විශේෂයෙන්ම 1968 මැයි- ජූනි සිද්ධීන්ගෙන් පසුව, බ්‍රිතාන්‍ය හා ප්‍රන්ස ශාඛාවන් දෙකම අත් කර ගත් වර්ධනය තුඩු දුන්නේ දේශපාලන ගැටුම්වලට ය. ඕසීඅයිහි මාධ්‍යමික දිශානතිය පිලිබඳ බ්‍රිතාන්‍ය ශාඛාවේ නිවැරදි විවේචන තිබිය දී ම, සෝෂලිස්ට් ලේබර් ලීගයේ නායකත්වය තුලම දේශපාලන මතභේද පැනනගිමින් තිබුනි. හජාජාක ලේකම්ව සිටි ක්ලිෆ් ස්ලෝටර්, හතරවන ජාත්‍යන්තරය යලි ගොඩනැඟීම පිලිබඳ ඕසීඅයිහි ඉල්ලීමට අනුකූලතාවක් දක්වන බව දැන සිටිය ද, නායකත්වය තුල එම ප්‍රශ්නය සාකච්ඡාවට ගැනුනේ නැත. එස්එල්එල්හි තවත් මුල් පෙලේ සාමාජිකයෙකු වූ මයිකල් බන්ඩා, මාවෝගේ " සංස්කෘතික විප්ලවය" හා වියට්නාම් ජාතික විමුක්ති පෙරමුනේ පිලිවෙත් සම්බන්ධයෙන් දැක්වූ අවිවේචනාත්මක ආකල්පය වෙත ද පලවූයේ එවැනිම මඟහැරීමේ ආකල්පයකි. එස්එල්එල් නායකත්වය මෙම වැදගත් ප්‍රශ්න පිලිබඳ විවෘත සාකච්ඡාවක් ගැනීමට අදි මදි කිරීම, හීලිගේ පැත්තෙන් පලවූ සාංකාවේ ම පිලිබිඹුවක් බව පෙනී ගියේය. එනම් තමාගේ ම සංවිධනය තුල හටගන්නා දේශපාලන ගැටුම, බ්‍රිතාන්‍ය ශාඛාව විසින් ප්‍රයෝගික හා සංවිධානාත්මක කටයුතුවල දී අත් කර ගත් ජයග්‍රහනවලට හරස් කපාවිය යන්නයි.

151. දේශපාලන ක්‍රියාමාර්ගය වර්ධනය කිරීමේ දී අත්‍යාවශ්‍යවන ඉදිරිදර්ශනය පිලිබඳ තීරනාත්මක ප්‍රශ්න විභාග කිරීමෙන් මගහැරීම, එස්එල්එල් තුල සුවිශේෂී න්‍යායික රූපයක් ගත්තේය. 1970-71 කාලයේ ඕසීඅයි සමඟ මතභේද උත්සන්න වෙද්දී, එස්එල්එල් නායකත්වය තර්ක කලේ දර්ශනවාදය පිලිබඳව ප්‍රකාශිත වෙනස්කම් සමඟ ගත්විට, මතභේදයට තුඩුදී ඇති දේශපාලන ප්‍රශ්න හුදෙක් දෙවැනි ගනයේ, නොවැදගත් ඒවා බවයි. දේශපාලන විශ්ලේෂනය පිලිබඳ අභ්‍යාසය තුල, දර්ශනවාදී ක්‍රමවේදය හෙලිදරව් වන්නේය යන සැලකිය යුතු සත්‍යය, දේශපාලන ප්‍රශ්න පිලිබඳ සංයුක්ත පරීක්ෂාව, ඊටත් වඩා වියුක්ත දර්ශනවාදී ඥාන විභාගය ගැන සාකච්ඡාවන් තුලට දියකර හැරීම යුක්ති සහගත කිරීම සඳහා පිටිවහල් කර ගැනිනි. අපෝහක භෞතිකවාදය "ඥානය පිලිබඳ න්‍යායක්" නොවේ යයි ඕසීඅයි විසින් සදොස් ලෙස අවධාරනය කල විට එය, ප්‍රන්ස සංවිධානයේ මාධ්‍යමික දේශපාලනය පිලිබඳ විභාග කිරීමකින් අවධානය ඉවතට හැරවීම සඳහා ඩැහැගනු ලැබින. ද්‍රව්‍යවාදී අපෝහක විධික්‍රමය වැදගත් ලෙස හා නියමාකාරයට යොදාගැනීම, දේශපාලන ඉදිරිදර්ශනය පිලිබඳ ප්‍රධාන ප්‍රශ්නවලට පැහැදිලි ලෙස ම සම්බන්ධය යනුවෙන් 1939-40 කාලයේ බර්න්හැම් හා ෂැට්මන්ට එරෙහි අරගලයේ දී ට්‍රොට්ස්කි විසින් ගන්නා ලද ප්‍රවිෂ්ටයට පටහැනිව, හීලි හා ස්ලෝටර් ඉදිරිපත් කලේ, අපෝහකවාදය ගැන සාකච්ඡාව දේශපාලන ප්‍රශ්න පසෙක තබන අතර, අවශ්‍ය නොවන තැනකට පවා ඇද දමයි යන ආස්ථානයයි.

152. 1971 සරත් කාලයේ එස්එල්එල් හතරවන ජාත්‍යන්තරයේ භේදයක් ප්‍රසිද්ධියට පත් කල අතර, භේදයට හේතු වූ දේශපාලන මතභේද පැහැදිලි නොකලේ ය. ධනේශ්වර අර්බුදය හා කම්කරු පන්තියේ අරගලයන් කෙරෙන් පැනනැගි තීරනාත්මක දේශපාලන ප්‍රශ්න රාශියක් හමුවේ, 1972 මාර්තු 1 වන දින නිකුත් කල ප්‍රකාශයෙන් එස්එල්එල් කියා සිටියේ භේදය, " හතරවන ජාත්‍යන්තරය ගොඩ නැඟෙන්නේ කෙසේද යන උපායාත්මක අංශයන් පිලිබඳව නොවේ. භේදය, සංවිධානය පිලිබඳ දූසිම් ගනනක් ප්‍රශ්නවලට හෝ විවිධ ප්‍රශ්න මත ඇතිවූ දේශපාලන ආස්ථානයන්ට පවා අදාල නොවේ."[92] ඒ වෙනුවට එස්එල්එල් අවධාරනය කලේ, "එය හතරවන ජාත්‍යන්තරයේ පදනම් කරා ම ගමන් කරන, මාක්ස්වාදී න්‍යාය මුල් කර ගත් දේශපාලන භේදයක් යනුවෙනි. එහෙත් මතභේදයට තුඩුදුන් සැබෑ දේශපාලන ප්‍රශ්න පිලිබඳව අවශ්‍ය සමාලෝචනයකින් තොරව "මාක්ස්වාදී න්‍යායේ" පිහිට පැතීම වනාහි, වියුක්ත පුරසාරමේ අභ්‍යාසයකට මඳක් වැඩි දෙයකි. සැබවින් ම, එස්එල්එල් දැන් කියාපාන්නේ තමන් "බ්‍රිතාන්‍ය තුල විප්ලවවාදී පක්ෂය ගොඩනැඟීමේ අත්දැකීම් තුලින්,

ක්‍රියාමාර්ගය හා ප්‍රතිපත්ති මත එකඟතාවය පිලිබඳ ප්‍රශ්නවලට වඩා බොහෝ ගැඹුරට ගිය, ආත්මීය චින්තන ක්‍රමවලට එරෙහිව පරිපූර්න හා දුෂ්කර අරගලයක් අවශ්‍ය බව" වටහා ගෙන ඇති බවයි. [93] මෙම ප්‍රකාශය ට්‍රොට්ස්කි දැරූ ආස්ථානයට ඍජු ලෙස ම විසංවාදීය. "ක්‍රියාමාර්ගයේ වැදගත්කම පක්ෂයේ වැදගත් කමයි" මෙම ක්‍රියාමාර්ගය සැදුම් ලද්දේ, "කර්තව්‍යයන් හා සිදුවීම් පිලිබඳ පොදු අවබෝධයකින් ය."[94] දැන් එස්එල්එල් කියා සිටියේ "ආත්මීයවාදී චින්තන ක්‍රමයන්ට එරෙහි අරගලය" - තරමක ගුඪ සූත්‍රගත කිරීමක් - ක්‍රියාමාර්ගික එකඟතාවට වඩා වැදගත් බවය. තවද එස්එල්එල්, තම වැඩ කටයුතු පදනම් වන්නේ ස්ටැලින්වාදයට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට හා පැබ්ලෝවාදයට එරෙහි හතරවන ජාත්‍යන්තරයේ අරගලයෙහි පාඩම්වලට වඩා "බ්‍රිතාන්‍ය තුල විප්ලවවාදී පක්ෂය ගොඩනැගීමේ" අත්දැකීම් මත යයි කියා සිටීමෙන් ප්‍රකාශිත වන්නේ, එහි දේශපාලන අක්ෂයේ කනස්සල්ල දනවන මාරුවකි. එනම් ජාත්‍යන්තරවාදයේ සිට ජාතිකවාදය දෙසට වන මාරුවකි.

153. හරියටම, ක්‍රියාමාර්ගික පැහැදිලිකම හැකි තාක් පුලුල් පරිමාවකින් අවශ්‍ය කෙරෙන, ලෝක ධනේශ්වර අර්බුදය ගැඹුරු වන ලක්ෂයේ දී ම, ඕසීඅයි සමග භේදයට යටින් පැවති දේශපාලන ප්‍රශ්න පැහැදිලි කිරීමට දක්වන අසමත් කම වනාහි, ජාත්‍යන්තර කමිටුවේ වැඩ කටයුතුවලට හරස් කැපීමකි. එස්එල්එල් නායකත්වය මුහුන දුන් ප්‍රමුඛ කාර්යය වූයේ, ක්‍රියාමාර්ගය. භාවිතය හා ජාත්‍යන්තර දිශානතිය පිලිබඳව ඕසීඅයිහි මාධ්‍යමික මාරුවෙහි දේශපාලන ඇඟවුම් උකහා ගැනීම ය. ජාත්‍යන්තර කමිටුවේ නව ශාඛාවන් ගොඩනැගෙමින් තිබෙන අවස්ථාවක, මෙය දැවැන්ත වැදගත්කමක් දරයි. විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය 1968 දී පිහිටුවන ලදී, ජර්මානු ශාඛාව ලෙස බුන්ඩ් සෝෂලිස්ට්ට්ිෂේ 1971 දි පිටුවන ලදී. 1973 දී සෝෂලිස්ට් ලේබර් ලීගය ඕස්ට්‍රේලියානු ශාඛාව ලෙස පිහිටු වීය. 1973 දී ග්‍රීසියේ නව ශාඛාව පිහිටුවන ලද්දේ එහි සාමාජිකත්වය හජාජාක හා ඕසීඅයි ආධාරකරුවන් අතර බෙදී තිබුනු තත්වයක් යටතේය.

154. 1960 ගනන් අවසානයේ හා 1970 ගනන් මුල ඕසීඅයිය, ප්‍රන්ස සමාජවාදී පක්ෂය නිර්මානය කිරීමට තුඩුදුන් තිරයට පිටුපස උපාමාරු දැමීමක දැඩි ලෙස නිමග්නව සිටි බව දැන් කවුරුත් දන්නා දෙයකි. සමාජවාදී පක්ෂය ගොඩනඟන අවධියේ ඕසීඅයි සාමාජිකයන්, ප්‍රංශුවා මිතරෝන් සමග සමීපව වැඩ කරමින් සිටියහ. ඒ, තරයේ ම අවස්ථාවාදී පදනමක, ඔහුගේ මැතිවරන බලාපොරොත්තුවල උපකරන ලෙසය. ඕසීඅයි සාමාජිකයන්ගෙන් කෙනෙක් වූ ලයනල් ජොස්පින් මිතරෝන්ගේ ආධාරකරුවෙකු විය. ඔහු සමාජවාදී පක්ෂ තන්ත්‍රය තුල ඉහල නගිමින් අවසානයේ අගමැති පුටුව හිමිකර ගත්තේය. එස්එල්එල් විවෘත දේශපාලන අරගලයක් ගෙන ගියේ නම්, ඕසීඅයිහි අවස්ථාවාදී පරිහානිය හා ප්‍රන්ස රාජ්‍යයේ දේශපාලන උපකරනයක් බවට එහි පරිවර්තනය අවහිර කල හැකිව තිබුනේද යන්න ප්‍රත්‍යක්ෂව නිගමනය කල නොහැකි වුවත්, එවන් අරගලයකින්, දේශපාලන ප්‍රශ්න පැහැදිලි කරනු හා එහි ම සාමාජිකත්වය තුල අවස්ථාවාදය වර්ධනය මඟින් එල්ල කල තර්ජනයෙන්, එස්එල්එල් බේරාගත හැකිව තිබුනි.

## කම්කරු විප්ලවවාදී පක්ෂය පිහිටුවීම හා 1973-75 ලෝක අර්බුදය

155. 1973 නොවැම්බරයේ දී, එස්එල්එල් කම්කරු විප්ලවවාදී පක්ෂය බවට පරිවර්තනය කිරීම, ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය මූලෝපායික අත්දැකීම් සමාලෝචනය කිරීමේ පදනම මත සුදානම් නොකෙරුනි. ඒ වෙනුවට එය ටෝරි අගමැති එඩ්වඩ් හීත්ගේ ආන්ඩුවට එරෙහි කම්කරු පන්ති ව්‍යාපාරය වෙත දැක්වූ, උපායික ප්‍රතිචාරයක් විය. කම්කරු විප්ලවවාදී පක්ෂය (කවිප) පිහිටුවීමේ සාකච්ඡාවලට ජාත්‍යන්තර කමිටුවේ සහභාගිත්වය, එස්එල්එල් විසින් මුලුමනින්ම පාහේ අත්හිටුවන ලදී. ආරම්භක සමුලුවෙන් පසුව, කවිපයේ වර්ධනයක් ඇතිකල කම්කරු පන්තියේ සටන්කාමිත්වයේ ප්‍රතිපල වශයෙන්, හීත් ආන්ඩුව ඇද වැටී කම්කරු ආන්ඩුවක් 1974 දී බලයට ගෙන ආ මෙම කාලය තුල, සංවිධානය ඇතුලත නැගී එමින් තිබුනු ගැටලු වැසී ගියේය.

156. 1973 හා 75 අවධියේ ලෝක ධනවාදය වෙලාගත් ආර්ථික හා දේශපාලන අර්බුදය තුල හීත් ආන්ඩුවේ වැටීම එක් සිද්ධියකි. රත්රන්-ඩොලර් පරිවර්තනයේ අවසාන වීමෙන් මුදාහල උද්ධමනකාරී චක්‍රය, ඇමරිකානු මුදල කෙරෙහි පොදු විශ්වාසයේ බිඳවැටීමක් මඟින් උග්‍ර කලේය. 1973 ඔක්තෝබරයේ මැද පෙරදිග යුද්ධය පුපුරායාම තුඩුදුන්නේ, ඔපෙක් සංවිධානය තෙල් මිල සිවු ගුනයකින් ඉහල දැමීමට ය. එය අනෙක් අතට, 1930 ගනන්වල මහා අවපාතයෙන් පසුව නරකම අවපාතය මුදාහලේය. 1974 අප්‍රේල් මාසයේ දී, අඩ සියවසකට ආසන්න කාලයක් බලයේ සිටි පෘතුගාලයේ සලසාර් ෆැසිස්ට් ආඥාදායකත්වය, ඇන්ගෝලා හා මොසැම්බික් වැනි අප්‍රිකානු රටවල විජිත විරෝධී කැරලි හා වැඩීගිය දේශීය අර්බුදය පතුලෙන් ඇති කල පීඩනය හමුවේ, හදිසියේ ම බිඳ වැටුනේය. මිලියන කිහිපයක ජනතා පෙලපාලියක් සහිතව ලිස්බන්හි ප්‍රථම නිල මැයි දින සැමරුම පැවැත්වුනි. 1974 ජූලි මාසයේ දී, 1967 බලය අල්ලාගත් ග්‍රීසියේ මිලිටරි ජුන්ටාව, සයිප්‍රසයේ ව්‍යසනකාරී මැදිහත්වීම හමුවේ බිඳ වැටුනි. 1974 අගෝස්තුවේ, ජනාධිපති රිචඩ් නික්සන්ට ඉල්ලා අස්වීමට සිදුවූයේ, වෝටගේට් සෝලිය හා පරිපාලනය විසින් නියෝග කල කාම්බෝජයේ නීති විරෝධී මිලිටරි කටයුතු හෙලිදරව් වීමේ ප්‍රතිපල වශයෙන්, ව්‍යවස්ථාදායකයේ අධිකරන කමිටුව විශ්වාස භංගය පිලිබඳ ලියවිලිවලට ඡන්දය දීමත් සමඟ ය. අවසාන

වශයෙන්, 1975 අප්‍රේල් මාසයේ වියට්නාම් විමුක්ති හමුදා සයිගොන් නගරයට ඇතුල්වූ අතර සිය රට එක්සත් කරමින්, ඉන්දු චීනය තුල ඇමරිකානු නව යටත් විජිතවාදී ඇඟිලි ගැසීම් නිර්ලජ්ජිත නිමාවකට ගෙන ආවේය.

## මතු සම්බන්ධයි

## සටහන්

[84] .ඩේවිඩ් නෝර්ත්: *අප රක්නා උරුමය, දෙවන කොටස* , කම්කරු මාවත ප්‍රකාශන, පි. 565.

[85] . තුන්වන ලෝක සම්මේලනයේ යෝජනා, 1966 අප්‍රේල් 8. *Trotskyism Versus Revisionism,* සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය, 5 වන වෙලුම (ලංඩන්හි නිව් පාක් ප්‍රකාශන, 1975) 25-7 දක්වා පිටු.

[86] .''ජාත්‍යන්තර සමුලුවට ඉදිරිපත් කල ස්පාටසිස්ට් ලියවිල්ල, *මාක්ස්වාදී අන්තර්ජාතික ලේඛනාගාරය* http://www.marxistsfr/etoldocument/1986/1966conf.html

[87] .*Fifty Years of World Revolution,* ලෝක විප්ලවයේ පනස් වසර, අර්නස්ට් මැන්ඩල් සංස්කරනය (1970, නිව්යෝර්ක් පාත්ෆයින්ඩර් ප්‍රෙස් ) 194-95 පිටු.

[88] ."1967 ජූනි 19 වන දින එස්එල්එල් මධ්‍යම කාරක සභාව විසින් ඕසීඅයි සංවිධානයට දුන් පිලිතුර" - *Trotskyism Versus Revisionism*, සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය, පස්වන වෙලුම (නිව් පාර්ක්, ලංඩන්, 1975) 111 වන පිටුව.

[89] .එම, 113-14 වන පිටු.හතරවන ජාත්‍යන්තරය සහ වුල්ෆර්ත් ද්‍රෝහියා

[90] .*The Fourth International and the Renegade Wohlforth,* හතරවන ජාත්‍යන්තරය සහ වුල්ෆර්ත් ද්‍රෝහියා, (නිව් යෝර්ක්: ලේබර් පබ්ලිකේෂන්ස්, 1984), පි. 209.

[91] .*Vietnam and the World Revolution,* වියට්නාමය හා ලෝක විප්ලවය, එම් මැක්ලෝග්ලින් ගෙන් උපුටා දැක්වීම (ඩිට්‍රොයිට් කම්කරු ප්‍රකාශන-1982) 85වන පිටුව.

[92] .*Trotskyism Versus Revisionism*, සංශෝධනවාදයට එරෙහිව ට්‍රොට්ස්කිවාදය, 6 වන වෙලුම (1975 නිව්පාර්ක් ලංඩන්) 72-78 වන පිටු.

[93] .එම, 83 වන පිටුව.

[94] .සමාජවාදී විප්ලවය සඳහා සංක්‍රමන ක්‍රියාමාර්ගය, ලියොන් ට්‍රොට්ස්කි (2001, පාත් ෆයින්ඩර්, නිව් යෝර්ක්) 207-8 වන පිටු.

© www.wsws.org